**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) ( ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2017 හි 3 වන පරිච්ඡේදයෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කල යුතු ක්‍රමවේදයට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය. | | |
| • වර්ෂය සඳහා අතිරික්තය රු.41,933,126 ක් වුවත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය යටතේ වර්ෂයේ අතිරික්කය රු.243,437,444 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනා සකස් කර ඉදිරිපත් කරන බව | වර්ෂයේ අතිරික්තය නිවැරදිව දැක්විය යුතුය. |
| • වර්ෂය තුල ස්ථාවර තැන්පතු වලින් මුදල් ආපසු ගැනීම් රු.7,096,030 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙසද නව ස්ථාවර තැන්පතු ආයෝජන රු.5,000,000 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යැමක් ලෙසද දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනා සකස් කර ඉදිරිපත් කරන බව | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් සහ ගලා යැම් නිවැරදිව දැක්විය යුතුය. |
| • ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම රු.84,885,223 ක් වුවත් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය යටතේ එය රු.14,391,280 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඉදිරිපත් කරන බව | ප්‍රාග්ධන වියදම් ප්‍රදාන නිවැරදිව දැක්විය යුතුය. |
| • වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම රු.11,574,523 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඉදිරිපත් කරන බව | මුදල් හා මුදල් සමාන දෑ නිවැරදිව දැක්විය යුතුය. |
| • වර්ෂ අවසාන මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම රු.12,040,678 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල එය රු.466,155 ක් ලෙස එනම් රු.11,574,523 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඉදිරිපත් කරන බව | මුදල් හා මුදල් සමාන දෑ නිවැරදිව දැක්විය යුතුය. |
| (ආ) පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2017 හි ජේද අංක 3.7 ප්‍රකාරව අස්තිත්වයක් පිළියෙල කල අයවැයලේඛනවල | 2021 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී ඉදිරිපත් කරන බව | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අයවැයගත තොරතුරු එම කාලපරිච්ඡේදය සඳහා වූ මුල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කලයුතු අතර එම ප්‍රමිතියේ 3.9 ඡේදය ප්‍රකාරව අයවැයගත හා සත්‍ය වටිනාකම් සංසන්දනය කල හැකි පරිදි වෙන් වෙන්ව ඉදිරිපත් කර එම වටිනාකම් අතර යම් ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හේතුද හෙළිදරව් කල යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන තුල අයවැයගත හා සත්‍ය වටිනාකම් සංසන්ධනාත්මක ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 52 හා 53 ඡේද ප්‍රකාරව ප්‍රත්‍යාගණන ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරණ අගය වැඩිවන විටක, එම වැඩිවීම සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කලයුතු අතර ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලයක් වශයෙන් වත්කම් පන්තියක ධාරණ අගය අඩුවීමක් සිදුවන විටක එම අඩුවීම අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත යුතුය. එහෙත් 2020 ජනවාරි 01 දිනට ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණයෙන් ඇති වූ ප්‍රතිඵල ඉහත පරිදි ගැලපීම් නොකර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට ගලපා තිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමුච්චිත අරමුදල් ගිණුම තුල වර්ෂයේ අතිරික්තය වූ රු.41,933,126 ක් ගැලපීම වෙනුවට වර්ෂයේ විස්තීර්ණ ආදායම වූ රු.126,818,350 ක් ගලපා තිබීමෙන් 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල රු.84,885,223 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව | |
| (ආ) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල වර්ෂයේ ස්කන්ධය සඳහා බලපෑමක් ඇති නොකරන රු.346,905,155 ක් වූ දේපල, පිරියත හා උපකරණ වටිනාකමද ඇතුලත් කර තිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට සමස්ථ ස්කන්ධය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය මගින් නව ශේෂ හඳුනාගත් බැවින් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල ස්ථාවර වත්කම් ගලපා ඇති බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)වර්ෂයේ සමුච්චිත අතිරික්තය රු.52,253,165 ක් වුවත් වත්කම් හා වගකීම් ප්‍රකාශනය තුල එය රු.285,370,570 ක් ලෙස එනම් රු.233,117,405 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | |
| (ඈ)වර්ෂයේ ස්කන්ධයට අයිති සංචිත හා වෙන් කිරීම් ශේෂය රු.668,297 ක් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.233,117,327 ක් 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය තුල දක්වා නොතිබුණි. | 2021 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව | |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.668,297 ක් වූ ස්ථාවර වත්කම් අදාල වත්කම් ගිණුම් වලට නිවැරදිව ගලපා තිබුණද එම පරිත්‍යාග වටිනාකම ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සංචිත හා වෙන් කිරීම් ගිණුමකට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ)වටිනාකම රු.7,980,490 ක් වූ උපයෝගී සේවා ගිණුම හා පළාත් සභා ණය ගිණුමද වටිනාකම රු.193,729 ක් වූ සේවක ඇප තැන්පත් හා සේවක ඇප ආයෝජන ගිණුම්ද වත්කම් හා වගකීම් ප්‍රකාශනය තුල දක්වා නොතිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට සභාව සතු වත්කම් හා වගකීම් නිවැරදිව නිරූපනය වී නොතිබුණි. | 2021 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව | |
| (උ)2020 දෙසැම්බර් 31 දිනට භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.2,633,644 ක් වූ තොග පොත් ශේෂය ගිණුම්ගත කර තිබුණි. | ආයුර්වේද භාණ්ඩ තොග ලේඛනය සමඟ පරික්ෂා කර එම තොග සමාන බැවින් අදාල ලේඛනවල අත්සන් තැබූ බව | භෞතික තොගය ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.211,744 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.381,061,277 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2021 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,933,126 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,632,274 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවෙන් වෙනමම ඒකකයක් ලෙස 2018 පෙබරවාරි 11 දින මිල්ලනිය ප්‍රාදේශීය සභාව ස්ථාපිත කිරීමත් සමඟ සභාව සතුව එවකට පැවති වත්කම් සභා දෙක අතර බෙදා හැරීම සම්බන්ධයෙන් සිදු කල විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ)මිල්ලනිය ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන ඔප්පු වටිනාකම රු.25,595,177 ක් වූ ඉඩම් කැබලි 100 ක් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් විධිමත්ව මිල්ලනිය ප්‍රාදේශීය සභාවට 2021 ජුලි 20 දින වන විටත් පවරා දීමට කටයුතු කර නොතිබුණි. | අදාල උපලේඛන ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින බව | වත්කම් පවරා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ)සභාව ස්ථාපිත කරන අවස්ථාවේ පැවති මිල්ලනිය ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි 13 ක් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් විධිමත්ව පවරා දීමට කටයුතු කර නොතිබුණි. | අදාල උපලේඛන ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින බව | වත්කම් පවරා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් 2019 සැප්තැම්බර් 20 දින වත්කම් බණ්ඩාරගම හා මිල්ලනිය ප්‍රාදේශීය සභා අතර සියයට 58 හා සියයට 42 අනුපාතයට බෙදීමට හඳුනාගෙන තිබුණද , බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් 2021 අප්‍රේල් 28 දිනැති මහ සභා රැස්වීමේදී එකඟ නොවීම නිසා සභාව ස්ථාපිත කර වසර 03 මාස 05 ක කාලයක් ගතවී තිබුණද වත්කම් බෙදීමක් සිදු කර නොතිබුණි. | 2021 අප්‍රේල් 28 මහා සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් එකඟ නොවීම නිසා කමිටුවක් පත්කර ඇති අතර ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවතින බව | වත්කම් බෙදීම කඩිනමින් කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කලයුතු වුවත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු 30 දින ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. | මිල්ලනිය හා බණ්ඩාරගම ප්‍රාදේශිය සභා අතර වත්කම් බෙදා නොතිබීම හේතුවෙන් අවසන් ගිණුම නියමිත දිනට සකස් කර තිබුණද විගණනය සමඟ සකච්ජා කර ඉදිරිපත් කළ බව | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |